මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\ **35** **2023.02.12**

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023

### ඡන්දදායකයා විසින් ඡන්ද පොළේ දී තම අනන්‍යතාවය තහවුරු කළ යුතු බවට කරනු ලබන දැන්වීමයි.

2023.03.09 දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී ඡන්දදායකයන් තමාගේ අනන්‍යතාවය තහවුරු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් අනන්‍යතා ලේඛන පමණක් පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;
2. වලංගු ගමන් බලපත්‍රය;
3. වලංගු රියදුරු බලපත්‍රය;
4. රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත;
5. වැඩිහිටි හැඳුනුම්පත;
6. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන පූජ්‍ය/ පූජක හැඳුනුම්පත;
7. ජාතික හැඳුනුම්පත් තොරතුරු තහවුරු කිරීමේ ලිපිය;
8. රියදුරු බලපත්‍ර අයදුම් කර ඇති සහ රියදුරු බලපත්‍ර අලුත් කිරීම සඳහා අයදුම් කර ඇති අයදුම්කරුවන් වෙත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන තාවකාලික රියදුරු බලපත්‍රය;
9. මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කළ විශේෂ හැඳුනුම්පත

02. ඉහත ලියවිලි හැර වෙනත් කිසිම ලියවිල්ලක් එනම් වෙනත් හැඳුනුම්පත්, සහතික කරන ලද ඡායාරූප හෝ ජාතික හැඳුනුම්පත් ඉල්ලුම්පත් භාර ගැනීමේ දී නිකුත් කරන කුවිතාන්සි යනාදි කිසිම ලියවිල්ලක් ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීම සඳහා වලංගු හැඳුනුම්පතක් වශයෙන් ඡන්ද පොළේ දී පිළිගනු නොලැබේ.

03. ඡන්ද පොළේ දී ඡන්ද හිමියාගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා ඉහත 1 – 9 දක්වා වූ හැඳුනුම්පත්වලින් කිසිවක් නොමැති හෝ තිබෙන හැඳුනුම්පත දුර්වර්ණ වීම නිසා අපහැදිලිවීම හෝ පුද්ගලයා හැඳුනුම්පතින් හඳුනාගත නොහැකි නම් එබඳු ඡන්ද හිමියන් මැතිවරණ කොමිෂන් සභාව මඟින් නිකුත් කරනු ලබන විශේෂිත හැඳුනුම්පත ලබා ගත යුතුය.

04. මැතිවරණ කොමිෂන් සභාව මඟින් නිකුත් කරන විශේෂ හැඳුනුම්පත ලබා ගැනීම සඳහා අයදුම්පත් ලබා ගැනීමේ අවසන් දිනය **2023.03.02** වේ. එබැවින් තාවකාලික හැඳුනුම්පත් ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් නොපමාව හැඳුනුම්පත අවශ්‍ය පුද්ගලයා තමාගේ උඩුකයේ පළල **සෙ.මී. 2 ½,** උස **සෙ.මී. 3** (1 ¼" x 1") ප්‍රමාණයේ (ජාතික හැඳුනුම්පත ප්‍රමාණයේ) කළු/ සුදු හෝ වර්ණ ඡායාරූප පිටපත් දෙකක් ද රැගෙන වසමේ ග්‍රාම නිලධාරී හෝ වත්තේ පදිංචි නම් වත්තේ වතු අධිකාරී හමු විය යුතු ය.

05. විශේෂ හැඳුනුම්පත් සඳහා අයදුම්පත් ග්‍රාම නිලධාරී/ වතු අධිකාරී වෙතින් ලබා ගත හැකි අතර, එම අයදුම්පත් සම්පූර්ණ කර ඡායාරූප පිටපත් දෙක ද සමඟ ග්‍රාම නිලධාරී/ වතු අධිකාරී වෙත භාර දිය යුතු ය. ඔවුන් විසින් ඡන්ද විමසීම දිනට පෙර අදාළ අයදුම්කරුවන් වෙත හැඳුනුම්පත් භාර දෙනු ඇත.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්